# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

2 ශ්‍රේණිය - ගණිතය / දෙවන වාරය / ජුනි මස 4 සතිය

සැකසුම - රත්නපුර කලාප අධ්‍යාපන කාර්යාලය

ඒ. එම්. එම්. ඩී. කුමාරි - ර/ පේසු බිළිඳුගේ කන්‍යාරාම ජාතික පාසල


## 19 පාඩම - දිග මැනීම හා සැසඳීම

ඔන්න දුවේ පුතේ මේ සතියේ ඔයාලට ආසාවෙන් කරන්න පුළුවන් වැඩක් තියන්නෙ. කැමතියි නේද?

ඔයාල ළඟ තියෙන ඇට මල්ල අරගන්න. මිදුලට ගිහින් මිදුලේ ඉරක් ඇඳලා ඒ ඉර උඩ හිටගෙන ඇට මල්ල ඈතට විසි කරන්න. දැන් කෝටුවක් අරං විසි කළ දුර මනින්න. අපි මීට පෙර දිග මැනපු හැටි මතකයි නේද? හරියටම කෝටුව තියල මනින්න ඕනි. කිප වරක් ම කරන්න.

- බලන්න ඔයාට කොතරම් දුර විසි කරන්න හැකි වුණා ද කියලා. පහතින් සටහන් කරන්න. මෙන්න මේ විදියට

ඇට මල්ල විසි කළ දුර කෝටුවෙන් 3 යි

1) පළමු වර විසි කළ දුර ..........................................................................................

2) දෙවන වර විසි කළ දුර ..........................................................................................

3) තෙවන වර විසි කළ දුර ..........................................................................................

- දැන් දුවේ පුතේ අපි කෝටුව වෙනුවට වෙනත් දෙයක් ගනිමු.

4) ඔබේ නිවසේ ලියන මේසයේ දිග පැන්සලෙන් මනිමු. ..........................................................................................

5) ඔබ නිදා ගන්නා ඇඳේ දිග බිම බටයෙන් මනිමු. ..........................................................................................

6) පැන්සල් පෙට්ටියේ දිග ගිනිකූරෙන් මනිමු. ..........................................................................................

- දැන් අපි දේවල් කීපයක දිග එක ම අභිමත ඒකකයකින් මනිමු.


ජනේලයේ දිග, මේසයේ දිග, පුටු සෙටියේ දිග බිම බටයෙන් මනින්න. ඒවායේ පින්තූර අභ්‍යාස පොතේ ඇඳ දිග ප්‍රමාණයන් ලියන්න.

ඒවායෙන් දිග වැඩි ම එක මොකද්ද? ..................................

දිග අඩුම එක මොකද්ද? ..................................

- දැන් ඔයාලා දේවල් කීපයක දිග මනින්න. ඊට පෙර ඒක කොපමණ දිගදැයි සිතා පිළිතුරක් දෙන්න ඕනි. ඊට පස්සෙ මැනල බලල නිවැරදි දිග ප්‍රමාණය ලියන්න. මෙන්න මේ ආකාරයට...

| දේවල් / ද්‍රව්‍ය | සිතූ දිග | මැන්න දිග |
|---|---|---|
| 1 බිත්තියේ දිග | කෝටුවෙන් 5 යි | කෝටුවෙන් 7 යි |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |



බලන්න ඔබ සිතූ දේ හරි ගියා ද? ටිච හිතපු දේ නම් පොඩ්ඩක් වැරදුණා.